**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2017**

**-------------------------------------------------**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(4) හා (8) උපවගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12(5) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණන විෂය පථය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වැනි වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතුවල ආයෝජනය වෙනුවෙන් ලැබිය යුතු රු.306,954 ක පොලිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 ජුලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 ඡේදය | 2017 මාර්තු 09 දින වාහනයක් විකිණීමෙන් ලද රු.1,126,500 ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් එම මුදල වර්ෂයේ වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 වගන්තිය | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද එම වාර්තාව ඉදිරිපත් කිරීම 2018 ජුලි 25 දක්වා මාස 04 කාලයක් ප්‍රමාද වී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.72,658,248 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.16,958,489 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.55,699,759 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉහත වර්ධනය කෙරෙහි වෙනත් ආදායම් රු.6,673,897 කින් වැඩිවීම සහ මහපොළ හා ශිෂ්‍යාධාර වියදම රු.345,654,700 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයේ වර්ධනයක් නිරීක්ෂණය වූ අතර 2015 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයේ පිරිහීමක්ද නැවතත් 2017 වර්ෂය අවසාන වන විට වර්ධනයක් ද ඇති වී තිබුණි. එහෙත් සේවක පාරිශ්‍රමික හා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ රු.152,474,415 ක් වූ දායකත්වය 2017 වර්ෂය අවසාන වන විට රු.319,284,616 ක් තෙක් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

#### (අ) විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

පසුගිය අධ්‍යයන වර්ෂ 3 සම්බන්ධයෙන් සලකා බැලීමේදී විශ්වවිද්‍යාල අධ්‍යයනය සඳහා අයදුම්කළ ශිෂ්‍ය සංඛ්‍යාව 2015/2016 සහ 2016/2017 අධ්‍යයන වර්ෂ 02 ක් තුළ පිළිවෙළින් 68,299 ක් හා 71,106 වී තිබුණ ද විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 29,110 සිට 30,668 දක්වා වී තිබුණි. මේ අනුව විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම්කළ ශිෂ්‍යයන්ගේ වැඩිවීමට සාපේක්ෂව විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සුළු වැඩිවීමක් පමණක් නිරීක්ෂණය විය.

| | 2013/2014 | 2014/2015 | 2015/2016 | 2016/2017 |
|---|---|---|---|---|
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අයදුම්කළ ශිෂ්‍ය සංඛ්‍යාව | 55,991 | 58,716 | 68,299 | 71,106 |
| විශ්වවිද්‍යාල අධ්‍යයනය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාවේ ආසන්න වර්ෂ 02 තුළ වැඩිවීම | | | 9,583 | 2,807 |
| විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | 25,200 | 25,676 | 29,110 | 30,668 |
| විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට තෝරාගත් ශිෂ්‍ය සංඛ්‍යාව ආසන්න වර්ෂ 02 තුළ වැඩිවීම | | | 3,434 | 1,558 |
| විශ්වවිද්‍යාල අධ්‍යාපනය අයදුම්කළ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාලයට තෝරාගත් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස | 45 | 43.7 | 42.6 | 43.1 |

#### (ආ) දේශීය සිසුන් ඇතුළත් කර ගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු

කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල සඳහා වාර්ෂිකව සිසුන් ඇතුළත් කිරීමේදී විවිධ පාඨමාලා සඳහා සුදුසුකම් ලබන සිසුන් එම පාඨමාලා යටතේ ලියාපදිංචි නොවීම, ලියාපදිංචි වූ සිසුන් වෙනත් පාඨමාලාවලට මාරුවීම, තවදුරටත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකරන ලෙස විශ්වවිද්‍යාලවලින් දැනුම්දීම සහ සිසු පුරප්පාඩු පිරවීම සඳහා කැඳවීම් කරන ලද අවස්ථා ගණන සීමා කිරීම යන කරුණු සිසු පුරප්පාඩු ඇතිවීම කෙරෙහි හේතුවී තිබුණි.

ඒ අනුව 2013/2014 අධ්‍යයන වර්ෂයේදී පැවති 1,794 ක් වූ සිසු පුරප්පාඩු සංඛ්‍යාව 2015/2016 අධ්‍යයන වර්ෂයේදී 2,226 දක්වා වැඩිවීමක් දක්නට ලැබුණ ද 2016/2017 අධ්‍යයන වර්ෂයේදී සිසු පුරප්පාඩු සංඛ්‍යාව 738 ක් දක්වා අඩුවී තිබුණි. සිසු පුරප්පාඩු පිරවීම සඳහා කැඳවීම් කරන ලද අවස්ථා ගණන 10 දක්වා වැඩි කිරීම ඉහත අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**(ඇ) විදේශීය සිසුන් ඇතුළත් කරගැනීමෙන් පසු ඇතිවන පුරප්පාඩු**

2011 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය විශ්වවිද්‍යාලවලට විදේශ සිසුන් බඳවා ගැනීමේදී අධ්‍යයන වර්ෂ 04කට අදාළව තොරතුරු පහත දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව | තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 2013/2014 | 58 | 14 | 44 |
| 2014/2015 | 18 | 9 | 9 |
| 2015/2016 | 38 | 17 | 21 |
| 2016/2017 | 53 | 5 | 48 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016/2017 අධ්‍යයන වර්ෂයේදී පාඨමාලා 05කට පමණක් විදේශ සිසුන් 53 ක් බඳවා ගැනීමට යෝජිතව තිබූ අතර එම පාඨමාලා 05 න් පාඨමාලා 04 කට විදේශ සිසුන් 05 දෙනෙකු පමණක් තෝරා ගෙන තිබූ අතර තවදුරටත් එම පාඨමාලා 05ට අදාළව පුරප්පාඩු 48 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) මේ අනුව යෝජිත විදේශ සිසුන් අතුරින් තවදුරටත් පවතින පුරප්පාඩු අනුව වෛද්‍ය, ඉංජිනේරු වැනි ඉතා ජනප්‍රිය පාඨමාලාවලට අදාළව පුරප්පාඩු 13 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව විදේශ සිසුන් සඳහා වෙන්කළ ප්‍රමාණය තවදුරටත් පුරප්පාඩුව පැවතුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2018 මාර්තු 22 දිනැති අංක යූජීසී/983/63 දරන කොමිෂන් සභා තීරණ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සංවර්ධන අරමුදල වෙත උපයන ලද ආදායමෙන් රු.මිලියන 58 ක් පමණක් මාරු කිරීමට අනුමැතිය ලබාදී තිබුණද, ඊට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.85,996,810 ක් අරමුදල් වෙත මාරු කර තිබුණද, ඒ තුළ වාහන විකිණීමෙන් ලත් රු.1,011,632 ක් හා පුනරාවර්තන ප්‍රදානවලින් ඉතිරි වූ රු.8,581,136 ක්ද ඇතුළත් වී තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ නිපුණතා මාර්ගගත පාඨමාලාව 2015/2016 අධ්‍යයන වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය ලද සිසුන්ගේ ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් නියමු ව්‍යාපෘතියක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර එහි ක්‍රියාත්මකභාවය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015/2016 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය වෙනුවෙන් සිසුන් 26,563 ක් ලියාපදිංචි කර තිබුණද උක්ත නියමු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යාපන ආයතනයේ - EEA(English For All) පාඨමාලාව සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ - ITUE (Information Technology for Universities Entrants) පාඨමාලාව යන පාඨමාලා 2 ට අදාළව ලියාපදිංචි වී තිබූ සිසුන් ප්‍රමාණය පිළිවෙලින් 4,997 ක් හා 2,012 ක් වැනි පහළ මට්ටමක පැවතුණි.

(ආ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන ලද ITUE පාඨමාලාව සඳහා ලියාපදිංචි වී සිටි සිසුන් 2,012 දෙනා අතුරින් පාඨමාලාව සාර්ථකව අවසන් කර සහභාගීත්ව සහතිකය ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 540 දෙනෙකු පමණක් වූ අතර එම ප්‍රමාණය ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 26 ක්ව පැවැති බව නිරීක්ෂණය විය.

(ඇ) මෙම වැඩසටහන වෙනුවෙන් 2017 වර්ෂයේ අයවැය යෝජනා මගින් රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් රු.මිලියන 3 ක් නිදහස් කර තිබුණද එම ප්‍රමාණයෙන් රු.මිලියන 1.9 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඈ) නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය අසාර්ථකවීමට හේතු ලෙස මෙම පාඨමාලාව හැදෑරීම සිසුන්ට අනිවාර්ය නොකිරීම, විශ්වවිද්‍යාල ප්‍රවේශයට පෙර වැඩසටහන ආරම්භකර අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීමට පෙර අවසන් නොකිරීම යන දුර්වලතා හේතු වී තිබුණු අතර එම දුර්වලතා මගහරවා විශ්වවිද්‍යාල සිසුන්ට ඵලදායී වන අයුරින් පාඨමාලාව පැවැත්වීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුකර නොතිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කොමිෂන් සභාව යටතේ පවත්වාගෙන යනු ලබන එකතුව රු.43,987,682 ක් වූ පර්යේෂණ හා විශේෂ අරමුදල් 4 ක් වර්ෂ කිහිපයක සිට එක් එක් අරමුදලට අදාළ පරමාර්ථ ඉටුකර ගැනීමට උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි.

(ආ) කොමිෂන් සභාවේ අක්‍රියව පැවති එකතුව රු.2,487,248 ක්වූ අරමුදල් 17 ක 2017 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශිෂ්‍යත්ව අරමුදලට බැර කිරීමත් සමඟ එම අරමුදලේ නව ශේෂය රු.13,159,144 ක් වී තිබුණි. එසේ වුවද එමගින් 2017 වර්ෂය තුළ ශිෂ්‍යත්ව ලබාදීම සඳහා උපයෝජනය කර තිබූ මුදල රු.222,500 ක් එනම් සියයට 1.7 ක ප්‍රමාණයක් පමණක් බව නිරීක්ෂණය විය. ශිෂ්‍යත්ව අරමුදලින් ප්‍රතිපූර්ණ කිරීමට විශ්වවිද්‍යාල විසින් ඉල්ලුම් කිරීමේ ප්‍රමාදයන්ද මේ සඳහා හේතු වී තිබුණි.

(ඇ) ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා කොමිෂන් සභාව විසින් පවත්වා ගෙන තිබූ අරමුදල් 12 කට අදාලව එකතුව රු.12,453,042 ක් අතුරින් අරමුදල් 05 කට අදාළව රු.1,053,625 ක් පමණක් අදාළ කාර්ය සඳහා උපයෝජනය කර තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දින වනවිට කොමිෂන් සභා සංවර්ධන අරමුදලේ පැවති රු.101,097,300 කින් අරමුදලට අදාළව කිසිදු වියදමක් දරා නොතිබූ අතර ඵලදායී අයුරින් කිසිදු ආයෝජනයක යොදවා නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 306 ක්ද තත්‍ය කාර්ය මණ්ඩලය 257 ක්ද වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 49 ක් විය. මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව පවතින පුරප්පාඩු අතරින් ප්‍රධාන ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, සහකාර ගණකාධිකාරී සහ සහකාර අභ්‍යන්තර විගණක යන තනතුරුවලට අදාළව පුරප්පාඩු සඳහා වසර 05 ක් ගත වී තිබුණ ද බඳවා ගැනීම් කටයුතු සිදුකර නොතිබුණි. මෙම තනතුරු අතරින් ප්‍රධාන ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක යන තනතුරු මගින් ඉටුකරන කාර්යයන් දැනට බඳවා ගෙන ඇති ගණකාධිකාරී හා අභ්‍යන්තර විගණක යන තනතුරු මගින් ඉටුකර ගත හැකි බැවින් මේ අවස්ථාවේදී ඉහත තනතුරු 02 වෙනුවෙන් බඳවා ගැනීම අවශ්‍ය නොවන බව 2018 අගෝස්තු 24 දින සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) 2011 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ සැලසුම් ඇතුළු අධ්‍යක්ෂ තනතුරු 04 ක් අනුමත වී තිබුණද මේ දක්වා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. අධ්‍යක්ෂ තනතුරු 03 ක පුරප්පාඩු පිරවීම මෙම අවස්ථාවේදී අවශ්‍ය නොවන බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරුවල දායකත්වය කොමිෂන් සභාවේ මූල්‍ය හා පරිපාලනමය කටයුතුවලට අදාළ කාර්යයන් හා අරමුණු හා ඉලක්ක කරා මෙහෙයවීමේදී ඉතා වැදගත් වුවද ඊට අදාළ තනතුරුවල පුරප්පාඩු පිරවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොමැති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම.

---------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත පරිදි 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු ලෙස තිරසාර සංවර්ධන අරමුණු 04 යටතේ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සමග සෘජුව බැඳුනු උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ හඳුනාගෙන තිබුණි. එසේවුවද එහි විෂය පථයට ගැනෙන අනෙකුත් අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් ඒ හා සම්බන්ධ වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැනබැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයක් ලෙස යෞවනයන් හා වැඩිහිටියන් යන පාර්ශවයන් හඳුනාගත හැකි වුවද, ආයතනය විසින් ඔවුන් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාළ ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) තිරසාර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටුකිරීමට අවශ්‍යවන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ඡේදය හා 4.3.2 ඡේදය ප්‍රකාරව නව සිව්මහල් ගොඩනැගිල්ලේ මහල් තුන සහ සේවක සම්පත්, අධ්‍යයන කටයුතු යන දෙපාර්තමේන්තුවල කාපට් ඇතිරීමත්, නව සිව්මහල් ගොඩනැගිල්ල සඳහා ලීබඩු උපකරණ මිලට ගැනීමටත් අදාළව මුළු පිරිවැය ඇස්තමේන්තු සකස්කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2, 5.3.2 සහ 5.6 ඡේද ප්‍රකාරව නව සිව්මහල් ගොඩනැගිල්ලට අවශ්‍ය ලීබඩු උපකරණ ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීමේදී ප්‍රසම්පාදනය කර ගැනීමට අපේක්ෂා කරන අයිතමයන්ට අදාළ පිරිවිතර ලංසු කැඳවීමේ ලේඛනවල ඇතුළත කර නොතිබියදී ලංසු ඇගයීමේ අවස්ථාවේදී එම පිරිවිතර සම්පූර්ණ කර නොතිබීම මත අවම ලංසු ප්‍රතික්ෂේප කර වැඩිම ලංසුවට ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තුව ලබාදී තිබුණි. එසේම සේවක සම්පත්, අධ්‍යයන කටයුතු සහ නීති අංශ සඳහා ලීබඩු ප්‍රසම්පදානයට අදාළ ලංසු කැඳවීමේදී අපේක්ෂා කරන දැව වර්ගය කුමක්ද යන්න ලංසු කැඳවීමේ පිරිවිතරවලට ඇතුළත් කර නොතිබියදී ඉදිරිපත් කර තිබූ අඩුම මිල පමණක් සැලකිල්ලට ගෙන ලංසු ප්‍රදානය කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 හා 2.8.4 ඡේද ප්‍රකාරව නවසිව්මහල් ගොඩනැගිල්ල වෙනුවෙන් රු.6,195,848 ක් වූ ලීබඩු උපකරණ මිලට ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) ඡේදය ප්‍රකාරව සේවක සම්පත්, අධ්‍යයන කටයුතු සහ නීති දෙපාර්තමේන්තු සඳහා වූ පිළිවෙළින් රු.9,866,500 ක් පිරිවැය දරා ලීබඩු ප්‍රසම්පාදන කිරීම, රු.1,298,148 ක් පිරිවැය දරා කාපට් ඇතිරීම සහ රු.7,629,150 ක් පිරිවැය දරා එම දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම යන ප්‍රසම්පාදන වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය ප්‍රකාරව සේවක සම්පත් නීති සහ අධ්‍යයන කටයුතු දෙපාර්තමේන්තුවල සිදු කර තිබූ රු.7,629,150 ක් වූ ඉදිකරීමට අදාළව එවැනි වැඩ අවසන් කිරීමේ සහතිකයක් ලබා දී නොතිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 පරිදි රු.මිලියන 05 ත් 10 ත් අතර ප්‍රසම්පාදනයේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත මිලදී ගැනීම සිදුකළ යුතුව තිබුණද රු.මිලියන 6.1 ක්වූ නව සිවුමහල් ගොඩනැගිල්ල සඳහා ලී බඩු මිලදී ගැනීමට අදාලව මිලදී ගැනීම සාධාරණ හේතු දැක්වීමකින් තොරව කොටස් 17 කට බෙදා ආයතනයේ සභාපතිගේ නිර්දේශය හා අනුමැතිය මත මිලදී ගැනීම සිදුකර තිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොමිෂන් සභා ශ්‍රවනාගාරයේ 2015 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතුවල යෙදී තිබූ කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඔහු වෙත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් ඉදිකිරීම් පවරන ලද කොන්ත්‍රාත්තුවට පරිබාහිරව කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව හා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ශ්‍රවනාගරයේ රු.3,393,330 ක අතිරේක වැඩ ඉටු කර

තිබුණි. එහෙත් කොන්ත්‍රාත් පරිපාලනයේ සිදුව තිබූ අඩුපාඩු හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණයක් මත එම කොන්ත්‍රාත්තුවට අදාළ ගෙවීම් අත්හිටුවා තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් කොමිෂමට එරෙහිව අධිකරණයේ පනවා තිබූ නඩුවක තීරණයක් මත මෙම මුදල 2017 මැයි 08 දින කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

(ආ) සේවක සම්පත්, නීති සහ අධ්‍යයන කටයුතු දෙපර්තමේන්තුවල සිදුකර තිබූ කාර්යාල පරිශ්‍ර වෙන් කිරීමට අදාළව පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබූ රේටයන්, අනුමත ගොඩනැගිලි රේටයන් (BSR) සමග පරීක්ෂාවේදී ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් කර තිබූ ප්‍රමාණපත්‍ර අයිතම 02 කට අදාළ රේටයන් අනුමත ගොඩනැගිලි රේටයන් ඉක්මවා පිළිවෙළින් රු.608 ක් හා රු.426 ක් වූ අධි රේටයන් ඇතුළත් කර තිබුණි.

(ඇ) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂයේ ආරම්භ කර, කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත අවස්ථා කිහිපයකදීම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබූ අතර අවසාන වශයෙන් 2017 අප්‍රේල් 10 දින දක්වා දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණ ද වැඩ නිම කිරීමට තව දුරටත් අමතර දින 130 ක කාලයක් ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේදී ප්‍රථමයෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේදී අනුමත කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවේ ඇතුළත් කර තිබූ නමුත් ඉදිකිරීම් අත්හිටුවා තිබූ රු.11,388,500 ක් පිරිවැය වූ අයිතම 3 ක් නැවත 2016 අගෝස්තු 22 දින ලංසු කැඳවා රු.14,987,055 ක අගයකට ලංසු ප්‍රදානය කර තිබුණි. ඒ අනුව කාල ප්‍රමාදය මත සිදුව තිබූ මිල විචලනය හේතුවෙන් රු.3,598,555 ක අමතර ඇස්තමේන්තු පිරිවැයක් දැරීමට සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

(ii) එසේම ඉහත කොන්ත්‍රාත්තුවට අදාළ ලංසු කැඳවීම 2016 අගෝස්තු 22 දින සිදු කර තිබුණ ද තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය මත ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානයට අනුමැතිය ලබා දීම සඳහා 2017 පෙබරවාරි 13 දින දක්වා දින 175 ක කාලයක් ගත කර තිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ව්‍යාපෘති පාලනය | නිවැරදි හා නිසි ඇස්තමේන්තු සකස් කර අදාල ඉලක්ක ලගා කර නොගැනීම හා ව්‍යාපෘති ඉදිකිරීම්වල ප්‍රමාදයන් ඇතිවීම |
| (ආ) | කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම හා කටයුතු කාර්යක්ෂම නොකිරීම |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | ප්‍රතිපාදනයට අදාළ අරමුණ සඳහා ඵලදායී අයුරින් උපයෝජනය නොකිරීම හා ඌන උපයෝජනය |
| (ඇ) | ප්‍රසම්පාදනය | ලංසු ඉදිරිපත් කිරීමේදී මුද්‍රාතබන ලද කවරයක බහා ඉදිරිපත් නොකිරීම |